# ආගමක් හෝ ලබ්ධියක් දැරීමේ නිදහස සියළු පුරවැසියන්ට සහතික කර තිබේද?

## ඔව්.

10 වන වගන්තිය - ආගමක් ඇදහීමට හෝ ආගම වෙනස් කිරීමට ඔබට නිදහස තිබේ.
14(1)(ඉ) - තනිව හෝ අන්‍යයන් සමගින් එක්ව, ප්‍රසිද්ධියේ හෝ පෞද්ගලිකව, ඔබගේ ආගම හෝ ලබ්ධිය ඇදහීමෙන්, පිළිපැදීමෙන්, ප්‍රගුණ කිරීමෙන් සහ ඉගැන්වීමෙන් ප්‍රකාශ කිරීමට ඔබට අයිතිය තිබේ.

### ආගමික නිදහස සම්බන්ධයෙන් පුද්ගලයකුට ඇති අයිතිය සීමා කළ හැකිද?

10 වන වගන්තිය පරම අයිතිවාසිකමක් වන අතර එය සීමා කළ නොහැකි නමුත්, 14(1)(ඉ) වගන්තිය යටතේ දක්වා ඇති තම ආගම ප්‍රකාශයට පත්කිරීමේ නිදහස ජාතික ආරක්ෂාව, වාර්ගික හා ආගමික සමගිය හෝ මහජන සෞඛ්‍ය හා සදාචාරය ආරක්ෂා කිරීම පිණිස 15(7) වගන්තිය යටතේ සීමා කළ හැකියි.
මෙම අයිතිවාසිකම සීමා කළ හැක්කේ පාර්ලිමේන්තුවෙන් සම්මත කෙරෙන නීතියක් මගින් පමණි.

### ආගමික වන්දනා ස්ථාන ලියාපදිංචි කිරීමේ නෛතික අවශ්‍යතාවයක් තිබේද?

ආගමික ස්ථාන ලියාපදිංචි කළයුතු බවක් නීතියෙන් නියම කර නැති නමුත් 2008 වසරේදී බුද්ධ ශාසන අමාත්‍යාංශය මගින් නිකුත් කළ චක්‍රලේඛයක දක්වා ඇත්තේ 'අළුතින් ඉදිවන සියළුම ආගමික වන්දනා ස්ථාන' සඳහා අමාත්‍යාංශය සහ අදාළ පළාත් පාලන ආයතනයෙන් නිසි පූර්ව අනුමැතිය ලබාගත යුතු බවකි. කෙසේ නමුත්, චක්‍රලේඛ යනු නීති නොවේ.
ඇතැම් ආගමික ස්ථාන (මුස්ලිම් පල්ලි) ස්වාධීන නියෝජිත ආයතන වෙත ලියාපදිංචි කළ හැකිය. නමුත් එය රජයෙන් නියම කළ යමක් නොවේ.

### ආගමික වන්දනා ස්ථානයක නෛතිකභාවය පිළිබඳව රජයේ නිලධාරීන් විසින් ප්‍රශ්න කරන විට හෝ ලියාපදිංචිය ඉල්ලා සිටින විට ගතයුතු පියවර කවරේද?

- ඔවුන්ගේ එම ප්‍රශ්න කිරීමේ නෛතික පදනම කුමක්දැයි නිලධාරීන්ගෙන් විමසීම.
- ඔවුන් 2008 චක්‍රලේඛය පිළිබඳව සඳහන් කළහොත්, එම චක්‍රලේඛයේ නෛතික පදනම කුමක්දැයි ඔවුන්ගෙන් විමසීම.
- 2008 චක්‍රලේඛය නිකුත් කර ඇත්තේ බුද්ධ ශාසන සහ ආගමික කටයුතු අමාත්‍යාංශයෙන් බවත්, වර්තමානයේදී ක්‍රිස්තියානි, හින්දු සහ මුස්ලිම්වරුන් පාලනය වන්නේ එම එක් එක් ආගමේ අමාත්‍යාංශ මගින් බවත් සඳහන් කිරීම.
- මුස්ලිම් පල්ලියක් නම්, පල්ලිය ස්වාධීනව පරිපාලනය කරන්නේ වක්ෆ් මණ්ඩලය මගින් බව රජයේ නිලධාරීන්ට දැනුම් දීම.
- මේ වෙනුවෙන් පෙනී සිටින NCEASL හෝ වෙනත් කණ්ඩායමකට කාරණය පිළිබඳව දැනුම් දීම.
- ලියාපදිංචි වන ලෙස නියම කරන්නේ කුමන නීතිය යටතේද යන්න දැනුම් දෙන මෙන් නීතීඥයකු හරහා එන්තරවාසියක් යැවීම.

### බලපත්‍රයක් යටතේ ලබාදුන් රජයේ ඉඩමක ආගමික වන්දනා ස්ථානයක් ඉදි කළ හැකිද?

නැත. බලපත්‍ර ඉඩම් හිමිවන්නේ රජයට වන අතර අදාළ බලපත්‍රයේ සඳහන් කර ඇති කොන්දේසි අනුව කටයුතු කළයුතු වේ. බලපත්‍ර යටතේ ඉඩම් ලබාදෙන්නේ පොදු කටයුතු හෝ වගා කටයුතු සඳහා වේ. එවන් බලපත්‍ර ඉඩම්වල ආගමික ස්ථාන සහ වාණිජ ක්‍රියාකාරකම් සිදු නොකළ යුතුයි.

### රජයෙන් බලපත්‍ර යටතේ ලබාදුන් ඉඩමක දැනටමත් ආගමික වන්දනා ස්ථානයක් පිහිටුවා ඇත්නම් කළ හැක්කේ කුමක්ද?

ගොඩනැගිල්ල හෝ ව්‍යුහය කඩාබිඳ දැමීම වලක්වාලීම සඳහා නියෝග කරන ලේඛනයක් විනිසුරුවරයකුගෙන් ලබාගත හැකියි (රිට් අයදුම්පතක් හරහා).

### ගොඩනැගිල්ල හෝ ව්‍යුහය කඩාබිඳ දැමීම වලක්වාලීම සඳහා නියෝග කරන ලේඛනයක් විනිසුරුවරයකුගෙන් ලබාගත හැකිද (රිට් අයදුම්පතක් හරහා)?

ඔව්. එවන් සිදුවීම් දණ්ඩ නීති සංග්‍රහ යටතේ අපරාධ නීතිය යටතට ඇතුළත් වේ.
290 වගන්තිය - ආගමික වන්දනා ස්ථානයකට හානි පමුණුවන ඕනෑම පුද්ගලයකුට දඩ නියම කිරීම හෝ වසර දෙකක් දක්වා වන සිර දඬුවමක් නියම කිරීම සිදුවේ.
291 වගන්තිය - ආගමික වන්දනාවක නිරතවන පුද්ගල කණ්ඩායමකට සිතාමතාම බාධා කරන්නා වූ ඕනෑම පුද්ගලයකුට දඩ නියම කිරීම හෝ වසර දෙකක් දක්වා වන සිර දඬුවමක් නියම කිරීම සිදුවේ.

### ආගමික වන්දනා ස්ථානයකට පහරදීමක් සිදුවුවහොත් ගතහැකි පියවර කවරේද?

- වහාම පොලීසියේ පැමිණිල්ලක් කර සිදුව ඇති සියළුම මූල්‍ය හානි නිසි ලෙස වාර්තා කර ඇති බව සහතික කරගන්න.
- අත්සන් තැබීමට පෙර පැමිණිල්ල හොඳින් කියවා බලන්න. සිංහලින් හෝ දෙමළින් පොලිස් පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකිය.
- ආගමික මතභේද සම්බන්ධයෙන් කටයුතු කරන විශේෂ පොලිස් ඒකකයට මේ පිළිබඳව දැනුම් දෙන්න.
- පොලිස්පතිවරයාගේ සහන සේවාවට දැනුම් දෙන්න.
  පහරදීමට සම්බන්ධ රජයේ නිලධාරීන් සිටින්නේ නම් ඔවුන්ට එරෙහිව මූලික අයිතිවාසිකම් නඩුවක් පැවරිය හැකිය.

### පැමිණිල්ල භාරගැනීම පොලීසිය ප්‍රතික්ෂේප කළහොත් කරන්නේ කුමක්ද?

- ප්‍රදේශයේ පොලිස්ථානයට ලියාපදිංචි තැපෑලෙන් පැමිණිල්ලක් යවා ලිපිය ලියාපදිංචි කළ ලදුපත ඔබ ළඟ තබාගන්න.
- ප්‍රදේශයේ පොලිස්ථානයේ ස්ථානභාර නිලධාරියාට ද පිටපත් කර සිදුවීම පිළිබඳව පොලිස්පතිවරයාට ලිඛිතව දැනුම් දෙන්න.
- පොලීසිය ඒ සම්බන්ධයෙන් අකර්මන්‍ය වේ නම් එය ජාතික පොලිස් කොමිසමට දැනුම් දෙන්න.
- සිදුවීමෙන් දින 30ක් ඇතුළත ඒ පිළිබඳව ජාතික මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කරන්න.
- පොලීසිය අකර්මන්‍ය බව දිගින්දිගටම පැවතුනහොත් පොලීසියට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පැමිණිලි කරන්න (මෙයද සිදුවීමෙන් මාසයක් ඇතුළත සිදු කළ යුතුය).
- වහාම නීතීඥවරයකුගෙන් නීති උපදෙස් ලබාගන්න.

### ශබ්ද දූෂණය සම්බන්ධයෙන් නීති තිබේද?

ඔව්. අපරාධ නඩුවිධාන සංග්‍රහයේ (1979 අංක 15 දරන පනත) 98-106 දක්වා වන වගන්ති යටතේ එම නීති දක්වා ඇත. ශබ්ද විකාශන යන්ත්‍ර භාවිතා කරන්නේ නම් ප්‍රදේශයේ පොලිස්ථානයෙන් ඒ සඳහා බලපත්‍රයක් ලබාගත යුතුය. අවශ්‍ය කරුණු සියල්ල සම්පූර්ණ වීමෙන් අනතුරුව පවා ශබ්ද බලපත්‍රය නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරන්නේ නම් පොලීසියට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු පැවරිය හැකිය.

### ආගමික හේතුවක් මත පොදු සුසානභූමියේ භූමදාන කිරීමට ඉඩදීම ප්‍රතික්ෂේප කළ හැකිද?

තම මළගිය ඇත්තන් පොදු සුසානභූමියේ වළදැමීමේ අයිතිය සියළුදෙනා සතුය. 1899 පොදු සුසානභූමි සහ භූමදාන පනතේ 13 වන වගන්තියේ සඳහන්ව ඇත්තේ ඕනෑම ආගමක චාරිත්‍රානුකූලව අවමංගල්‍ය මෙහෙය පැවැත්විය හැකි බවයි.

### පොදු සුසානභූමියක භූමදාන කිරීම ප්‍රතික්ෂේප වුවහොත් ගතයුතු පියවර කවරේද?

- අදාළ ප්‍රදේශයේ පොලිස්ථානයේ පැමිණිල්ලක් කර භූමදානය සඳහා ඉඩ ලබාදෙන නියෝගයක් නිකුත් කරන මෙන් මහේස්ත්‍රාත් අධිකරණයෙන් ඉල්ලා සිටීම (1979 අංක 15 දරන අපරාධ නඩුවිධාන සංග්‍රහයේ 136(අ) වගන්තිය).
- කරුණු පිළිබඳව ප්‍රාදේශීය ලේකම් වෙත පෙත්සමක් ගොනු කොට නියමිත කාල සීමාවක් තුළ මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගන්නා මෙන් ප්‍රාදේශීය ලේකම්වරයාගෙන් ඉල්ලා සිටීම. ඔහු/ඇය එකී කාලය තුළ ක්‍රියාමාර්ගයක් ගැනීමට අසමත් වුවහොත් තමන්ගේ රාජකාරිය ඉටු නොකිරීම සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්ට එරෙහිව නඩුවක් ගොනුකළ හැකිය.

### වෛරී කථනය පාලනය වන නීති කවරේද?

2007 සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර ප්‍රඥප්ති පනතේ 3 වන වගන්තිය අනුව වාර්ගික හෝ ආගමික වෛරය වැපිරීම වරදක් වේ.

### ඔබව වෛරී කථනයට භාජනය වුවහොත් ගත යුතු පියවර කවරේද?

- පොලීසියේ සහ ජාතික මානව හිමිකම් කොමිසමේ පැමිණිලි කරන්න.
- පොලීසිය අකර්මන්‍ය වේ නම් ඒ පිළිබඳ පොලිස් කොමිසමට පැමිණිලි කරන්න.
- මහාධිකරණයේ නඩුවක් ගොනු කරන්න.

Brochure 4-fold - Sinhala.indd 1-4 6/16/2016 9:39:00 AM

## ඔබගේ ආගමික විශ්වාසය මත පදනම්ව ඔබේ දරුවා පාසලට ඇතුළත් කරගැනීම ප්‍රතික්ෂේප කළ හැකිද?

අධ්‍යාපන ආඥාපනතේ (1939 අංක 31) විධිවිධාන ප්‍රකාරව ආගම, ජාතිය, වර්ගය, කුලය, සමාජ තත්වය හෝ භාෂාව මත පදනම්ව රජයේ පාසල්වලට ඇතුළත් කිරීම ප්‍රතික්ෂේප කල නොහැක. එසේ ළමයෙකු පාසලට ඇතුළත් කරගැනීම ප්‍රතික්ෂේප කරනු ලැබුවහොත්, ගත හැකි ප්‍රතිකර්ම පහත දක්වා තිබේ (මානව හිමිකම් උල්ලංඝනය වීමකි).

## තමන්ගේ විශ්වාසයට අනුකූල නොවන ආගමික චාරිත්‍ර පිළිපදින මෙන් ළමයෙකුට බලකිරීමට හැකිද?

එසේ ළමයෙකුට බලකිරීමට නොහැක. තමන්ගේ ආගමික විශ්වාසය නොවන ආගමක චාරිත්‍ර හෝ ප්‍රතිපත්ති අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් ළමයකු දඬුවමකට හෝ වෙනස්කොට සැලකීමකට ලක් කළ නොහැක.
එවන් යමක් සිදුවුවහොත් කළාපීය සහ කොට්ඨාශ අධ්‍යාපන අධ්‍යක්ෂකවරුන් වෙත සහ ජාතික මානව හිමිකම් කොමිෂන් සභාවට ඒ පිළිබඳව පැමිණිලි කළ හැකිය.

## තමන්ගේ මූලික අයිතිවාසිකම් උල්ලංඝනය වී ඇත්නම් ගතයුතු පියවර කවරේද?

- වහාම ජාතික මානව හිමිකම් කොමිෂන් සභාවට පැමිණිලි කරන්න. එහි පැමිණිල්ලක් කිරීමට ඔබට නීතීඥයකු වුවමනා නොවේ. උල්ලංඝනය සිදුවී මාසයක් තුළ පැමිණිල්ල සිදුකළ යුතු වේ. මාසයක් තුළ පැමිණිල්ල කිරීමට නොහැකි වුවහොත් අවම වශයෙන් තෙමසක් තුළ හෝ එම පැමිණිල්ල සිදුකිරීමට ඔබ කටයුතු කරන්න.
- ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනු කරන්න. උල්ලංඝනය සිදුවී දින 30ක් ඇතුළත නඩුව ගොනුකළ යුතුය. සැ.ක.යු: මූලික අයිතිවාසිකම් නඩු ගොනුකළ හැක්කේ රජය/රජයේ නිලධාරීන්ට එරෙහිව පමණි.
- උපකාර ලබාගැනීම සඳහා මීට අදාළ අනෙකුත් රාජ්‍ය ආයතන සමගින් සම්බන්ධ විය හැකිය. සිදුවන සියළු කටයුතු ලිඛිතව සිදු කෙරෙන ලිපි ගනුදෙනු හරහා සිදු වන බවත්, එම ලිපි ලියාපදිංචි තැපෑලෙන් යවන බවත්, සහතික කරගන්න. එවිට සිදුවූ ලිපි හුවමාරුව පිළිබඳව ඔබ වෙත සාක්ෂි ඉතුරුවනු ඇත.

# ආගමික නිදහස උල්ලංඝනය වුවහොත් සම්බන්ධ කරගත යුතු සංවිධාන

### ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව

ජාතික මානව හිමිකම් කොමිෂන් සභාව යනු රටේ මානව හිමිකම් ප්‍රවර්ධනය සහ ආරක්ෂා කිරීම සඳහා ඇතිකර තිබෙන ස්වාධීන කොමිසමකි. වින්දිතයා විසින්ම හෝ වින්දිතයා වෙනුවෙන් වෙනත් පුද්ගලයකුට හෝ පැමිණිල්ල ඉදිරිපත් කළ හැක. ඒ සඳහා නෛතික නියෝජනයක් වුවමනා නොවේ.

**ලිපිනය:** 165, කිංසි පාර, කොළඹ 8
**දුරකථන:** 011-2694925, 2685980, 2685981, 2685339
**ක්ෂණික ඇමතුම්:** 011-2689064
**ඊ මේල්:** sechrc@sltnet.lk
**වෙබ් අඩවිය:** www.hrcsl.lk
**ශාඛා:** යාපනය, වවුනියාව, අනුරාධපුර, ත්‍රිකුණාමලය, කල්මුනේ, බදුල්ල, මහනුවර, මාතර, නුවර එළිය, අම්පාර

### ජාතික පොලිස් කොමිසම

පොලිස් නිලධාරීන් හෝ පොලිස් සේවයට එරෙහිව සිදුකරන පැමිණිලි විමර්ෂණය කර සහන ලබාදීමේ බලය පොලිස් කොමිසමට ඇත.

**ලිපිනය:** බ්ලෝක් 9, BMICH, බෞද්ධාලෝක මාවත, කොළඹ 7
**දුරකථන:** 011-5107721, 5107722
**ෆැක්ස්:** 011-2683307
**ඊ මේල්:** info@npc.gov.lk
**වෙබ් අඩවිය:** www.npc.gov.lk

### අධ්‍යාපන අමාත්‍යාංශය

අධ්‍යක්ෂ ජෙනරාල්වරයා හෝ අමාත්‍යවරයා ආමන්ත්‍රණය කර, පාසල් සම්බන්ධයෙන් වන පැමිණිලි අමාත්‍යාංශය වෙත යැවිය හැකිය.

**ලිපිනය:** ඉසුරුපාය, පැලවත්ත, බත්තරමුල්ල
**දුරකථන:** 011-2784810, 2785141-50
**ෆැක්ස්:** 011-2785162
**ඊ මේල්:** info@moe.gov.lk
**වෙබ් අඩවිය:** www.moe.gov.lk

### සංචාරක සංවර්ධන සහ ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යාංශය

**ලිපිනය:** 6 වන මහල, රක්ෂණ මන්දිරය, 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 2
**දුරකථන:** 011-2321222
**ෆැක්ස්:** 011-2436672
**ඊ මේල්:** johnaeamaratunga@gmail.com

### බුද්ධ ශාසන අමාත්‍යාංශය

**ලිපිනය:** 135, ශ්‍රීමත් අනගාරික ධර්මපාල මාවත, කොළඹ 3
**දුරකථන:** 011-2303285, 5979999
**ෆැක්ස්:** 011-2303275
**වෙබ් අඩවිය:** mbra.gov.lk

### මුස්ලිම් ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**ලිපිනය:** 180, ටී. බී. ජයා මාවත, කොළඹ 10
**දුරකථන:** 011-2691864, 2675367
**ෆැක්ස්:** 011-2303275

### හින්දු ආගමික සහ සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුව

**ලිපිනය:** 248-1/1, ගාලු පාර, කොළඹ 4
**දුරකථන:** 011-2552641
**ෆැක්ස්:** 011-2552825
**ඊ මේල්:** hindudir@yahoo.com
**වෙබ් අඩවිය:** www.hindudept.gov.lk

### ශ්‍රී ලංකා ජාතික ක්‍රිස්තියානි ධර්මදාන සන්ධානය (NCEASL)

ඉවැන්ජලිස්ත කිතුණු ප්‍රජාවේ නියෝජිත ආයතනය ලෙස සුළුතර ජනයාගේ ආගමික නිදහස ආරක්ෂා කිරීමට NCEASL ආයතනය කැප වී සිටියි.

**ලිපිනය:** තැ. පෙ. 113, දෙහිවල, ශ්‍රී ලංකා
**දුරකථන:** 011-5511358
**ඊ මේල්:** legal@nceasl.org
**වෙබ් අඩවිය:** www.nceasl.org

# ඔබ දන්නවාද?

## ආගමක් හෝ ලබ්ධියක් දැරීමේ නිදහස පිළිබඳව නිතර අසන ප්‍රශ්න

NCEASL

Brochure 4-fold - Sinhala.indd 5-8
6/16/2016 9:39:00 AM